# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 44: 18-21, 23-29, 45: 1-5

"ඔබගේ ගැළවීම සඳහා සමිඳාණන් වහන්සේ මා ඊජිප්තුවට යැවූ සේක."

එවිට ජුදා ජෝසෙප් ළඟට පැමිණ, "මාගේ ස්වාමිනි, කරුණාකර ඔබට පෞද්ගලිකව වචනයක් කීමට ඔබේ දාසයාට අවසර දෙනු මැනව. ඔබේ දාසයාට විරුද්ධව ඔබේ කෝපය නොඇවිළේවා! ඔබ ඇත්තෙන්ම පාරාවෝ සහ සමාන ය. "නුඹලාට පියෙක් හෝ සහෝදරයෙක් හෝ සිටීදැ"යි මාගේ ස්වාමින් වන ඔබ දාසයන් වන අපෙන් ඇසුවෙහි ය. අපි මාගේ ස්වාමින් අමතා "මහලු වියේ සිටින පියෙක් ද, මහලු වියේ ඔහු ලැබූ කුඩා ළමයෙක් ද අපට ඇත. ඔහුගේ සහෝදරයා මළේය. මවගේ දරුවන්ගෙන් ඉතිරිව ඇත්තේ ඔහු පමණයි. ඔහුගේ පියා ද ඔහුට ප්‍රේම කරයි කියා" කීවෙමු. එවිට ඔබ ඔබේ දාසයන් අමතා "මට ඔහු බලා දැකගන්න පිණිස ඔහු ගෙනෙන්නැ"යි කීවෙහිය. අපි එවිට "ළමයාට නම් පියා අත්හැර එන්න බැරිය. පියාගෙන් ඔහු වියෝවී ආවොත් පියා මැරේවි" කියා කීවෙමු. ඔබ එවිට ඔබේ දාසයන් අමතා, "නුඹලාගේ බාල සහෝදරයා නුඹලා සමඟ ආවොත් මිස මින්පසු නුඹලා මා ඉදිරියට නො ආ යුතුය"යි කීවෙහි ය.

"තවද, අපි ඔබේ දාසයා වන මාගේ පියා වෙත පැමිණි විට මාගේ ස්වාමියා කී දේ ඔහුට සැළ කළෙමු. අපගේ පියා 'නැවත ගොස් කෑම ටිකක් අපට මිලයට ගන්න ය'යි කීවේය. එවිට අපි, 'අපට නම් යන්න බැරිය. අපගේ බාලම සහෝදරයා අප සමඟ යනොත් නම් අපි යමු. මන්ද, අපේ බාලම සහෝදරයා අප සමඟ නැත්නම් අප අධිපති තැන ඉදිරියට නොයා යුතු ය"යි කීවෙමු. එවිට

ඔබේ දාසයා වන මාගේ පියා අපට කතා කොට, “මාගේ බිරිඳ මට දාව පුත්‍රයන් දෙදෙනෙකු බිහි කළ බව තුඹලා දන්නහු ය. එක්කෙනෙකු මාගෙන් වියෝ වී ගිය විට ඇත්තෙන්ම සතෙකු ඔහු කැලි කැලිවලට ඉරා දමා ඇතැයි මම කීවෙමි. මන්ද, එවක් පටන් මම ඔහු නුදුටිමි. ඔබ මොහුවත් මාගෙන් රැගෙන ගොස් මොහුට අනතුරක් වූයේ නම්, තුඹලා මා පැසුණු හිසකේ එක්ක වළ පල්ලට අරින්නට හදන්නහු දැ”යි කීය.

එවිට ජෝසෙප් තමා ළඟ සිටි පිරිවර ඉදිරියේ තමන් සිත වාවාගත නොහැකි වී, “සියල්ලන් ම මා වෙතින් ඉවතට යන්ට හරින්නැ”යි හඬ නැගුවේය. මෙසේ ජෝසෙප් ඔහුගේ සහෝදරයන්ට තමන්ම හඳුන්වා දෙන විට ඔහු සමඟ අන් කිසිවෙක් එහි නොසිටියේ ය. මිසර වාසීන්ට ද පාරාවෝගේ රජ වාසල අයට ද එය ඇසිණි. ජෝසෙප් ඔහුගේ සහෝදරයන් අමතමින්, “මම ජෝසෙප් ය. මාගේ පියා තවම ජීවත්ව සිටීදැ”යි ඇසීය. ඔහුගේ සහෝදරයන් ඔහු දැකීමෙන් තුෂ්නිම්භූතව සිටි හෙයින් ඔහුට උත්තර දී ගන්නට ඔවුන්ට නොහැකි විය.

නැවත ජෝසෙප් තම සහෝදරයන් අමතා, “කරුණාකර මාළඟට එන්නැ”යි කී විට ඔවුන් ද ළං වූයෙන් “ඔබ මිසර දේශයට විකුණූ ඔබේ සහෝදරයා වන ජෝසෙප් මම ය. ඔබ මා මෙහි විකුණූ නිසා කරදර නොවන්න. නොතැවෙන්න. මන්ද, ඔබේ ජීවිතය රකිනු පිණිස ඔබට පෙරටුව දෙවියන් වහන්සේ මා මෙහි එවූ සේක” යැයි පැවසීය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 105 : 16 – 21

පිළිතුර: සමිඳුන් කළ පුදුම ක්‍රියා සිහි කරමු.

ගීය:

සමිඳාණෝ දේශයට සාගතයක් පැමිණවූ සේක.
කෑම හානියක් ඇති කරවූ සේක.
එහෙත් එතුමාණෝ ඔවුන්ට පෙරටුව මිනිසෙකු යැවූ සේක. එනම් වහල්කමට විකුණන ලද ජෝසෙප් ය.

ඔහුගේ පාදවලට විලංගු දමන ලදි. ගෙල වටා යකඩ වළල්ලක් දමන ලදි. ඔහු කී අනාගත කීම ඉටුවන තුරු සමිඳුන්ගේ අතින් ඔහු පරීක්ෂා කරන ලදි.

එවිට මිසරයේ රජ ඔහු මුදා හරින්ට අණ කළේය. ජාතීන්ගේ පාලකයා ඔහු නිදහස් කළේය.
රජතුමා රාජකාරිය ඔහුට බාර දුන්නේය. මුළු දේශයේ ආණ්ඩුකාරයා ලෙස ඔහු පත් කළේය.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ඔබේ සිත් දැඩිකර නොගන්න.
සමිඳාණන්ගේ හඬට සවන් දෙන්න.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ.
දේව රාජ්‍යය ආසන්න ය. මනස්ථාපනය වී සුබ අස්න අදහා ගන්නැ”යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 10: 7-15

"ඔබ නොමිලයේ ලැබුවහු ය. නොමිලයේ දෙන්න."

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක. "ස්වර්ග රාජ්‍යය ළං වී ඇතැ"යි දේශනා කරන්න. රෝගීන් සුව කරන්න. මළවුන් නැගිටුවන්න, ලාදුරු රෝගීන් පවිත්‍ර කරන්න. යකුන් දුරු කරන්න. ඔබ නොමිලයේ ලැබුවහු ය. නොමිලයේ දෙන්න. ඔබේ පසුම්බිවල රන් හෝ රිදී හෝ තඹ කාසි හෝ ගෙන නොයන්න. ගමන් මල්ලක්වත්, කමිස දෙකක්වත්, වහන් සඟලක්වත්, සැරයටියක්වත් සපයා නොගන්න. මන්ද, සේවකයාට අවශ්‍ය දේ ඔහු ලැබිය යුතු ය. ඔබ කවර නුවරකට හෝ ගමකට හෝ ඇතුල් වූ කල ඔබ පිළිගන්නට සතුටු කෙනෙකු සොයාගෙන, ඉන් නික්ම යනතුරු එහිම නැවතී ඉන්න. ගෙදරකට ඇතුල්වන විට එයට සුබ පතන්න. ගෙයි වැසියෝ සුදුසු අය නම්, ඔබේ ඒ සුබ පැතුම ඔවුන් පිට පැමිණේවා. එහෙත් නුසුදුසු නම් ඔබගේ ඒ සුබ පැතුම යළි ඔබ වෙත පැමිණේවා. කවරෙකු වුව ද ඔබ පිළිගන්නේවත්, ඔබගේ වචන අසන්නේවත් නැත්නම් ඒ ගෙදරින් හෝ ඒ නුවරින් හෝ නික්ම යන කල ඔබේ පාදවල දූවිලි ගසා දමන්න. සැබැවින්ම මම ඔබට කියමි. දේව විනිශ්චය දවසේ දී ඒ නුවරට වඩා සොදොම් සහ ගොමෝරා රටට සහනය ලැබෙන්නේය.

සුවිශේෂ වාක්‍යය එසේය.